" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / General Telephone 011 - 2093000

ISO 9001
SLAB ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/23 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.04. 30 |

## මූල්‍ය චක්‍රලේඛ 01/2025 (I)

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් (බ.ප) ,
සභා ලේකම් (බ.ප.),
සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් (බ.ප.),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) (බ.ප),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),
බස්නාහිර පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

### අක් මුදල් සීමා නියම කිරීම හා සංශෝධනය කිරීම - 2025 වර්ෂය

2025 වර්ෂය වෙනුවෙන් ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුමත කර ඇති වියදම් ඇස්තමේන්තු හා පැවරී ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා වූ අක් මුදල් අවශ්‍යතාවය හා එම අක් මුදල් අවශ්‍යතාවය මාසිකව හා වියදම් අයිතම අනුව සකස් කරන ලද අයදුම් පත්‍ර හා අක්මුදල් සීමා නියම කිරීම් හා සංශෝධනය කිරීම් වලට අදාලව හඳුන්වාදෙන ගූගල් පෝරමය පිරවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඉදිරි කාලයේ දී ලැබේ යැයි සනාථ කරන ලද ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අක්මුදල් අයදුම් පත්‍රය හා අග්‍රිම ප්‍රකාශනය සකස් කළ යුතු වේ.

2. ආකෘති පත්‍ර:-

I. වාර්ෂික අක් මුදල් අයදුම් පත්‍රය (අක් මුදල් සීමා නියම කිරීම හා සංශෝධනය කිරීම)
(අ) ආකෘති පත්‍රය

II. වාර්ෂික අක් මුදල් අවශ්‍යතාව - මාසික අවශ්‍යතාවය අනුව පිළියෙල කිරීම
(ආ) ආකෘති පත්‍රය

III. වාර්ෂික අක් මුදල් අවශ්‍යතාව -වියදම් අයිතම අනුව
ඇමුණුම I

පහත ආකාරයට පළාත් භාණ්ඩාගාර වෙබ් අඩවියට පිවිස මෙම ආකෘති පත්‍ර භාගත කර ගත හැකිය.

Fin.chiefsec.wp.gov.lk ⟶ View in English ⟶ Downloads ⟶ Formats ⟶ Imprest Limit Formats 2025

3. අයදුම් පත්‍ර පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු වලට විශේෂ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

I. වෙනත් කාර්යාල වලින් ලැබෙන ප්‍රතිපාදන ද මෙයට ඇතුළත් විය යුතුය.

II. වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබිය හැකි ප්‍රතිපාදන " අ " ආකෘති පත්‍රයේ "3" තීරුවේ සඳහන් කළ යුතුය. එසේ සඳහන් කළ යුත්තේ එවැනි ප්‍රතිපාදන ලබා දෙන බවට අදාළ දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලැබී ඇත්නම් පමණි.

III. "අ" ආකෘති පත්‍රයේ "8" තීරුව යටතේ දැක්විය යුත්තේ ඔබ කාර්යාලයට පළාත් භාණ්ඩාගාරයෙන් 2025 වර්ෂය වෙනුවෙන් අවශ්‍ය වන අක්මුදල් ප්‍රමාණය වේ. මෙම මුදල් පළාත් භාණ්ඩාගාරය විසින් මුදාහරිනු ලබන්නේ මාසික පදනම යටතේ බැවින් එය ගණන් බලා ගත හැකි වන පරිදි මෙයට යා කර ඇති "ආ" ආකෘති පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

IV. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා "අ" ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ශීර්ෂ අංක : 109 වැඩසටහන 03 ව්‍යාපෘතිය 02 යටතේ මෙතෙක් වෙන් කරන ලද ප්‍රතිපාදන "2" තීරුව යටතේ දැක්වීමටත්, පළාත් සභාවේ වෙනත් කාර්යාල වලින් ලැබී ඇති ප්‍රතිපාදන "3" තීරුවේ දැක්වීමට කටයුතු කළ යුතුවේ.

V. "අ" ආකෘති පත්‍රයේ "8" තීරුව යටතේ සඳහන් මුදල, වියදම් අයිතම අනුව වෙන් කොට මාසික පදනම යටතේ ඇමුණුම 1 හි දැක්වීමටත් කටයුතු කළ යුතුවේ.

4. 2025 වර්ෂය වෙනුවෙන් අක්මුදල් සීමාව නියම කිරීමට අදාලව සාරාංශ තොරතුරු ලබා ගැනීම සඳහා ගූගල් පෝරමයක් (Google Form) පළාත් භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇත. ඉහතින් සඳහන් කළ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පහත ආකාරයට පළාත් භාණ්ඩාගාර වෙබ් අඩවියට පිවිස එම ගූගල් පෝරමය පිරවීමට කටයුතු කළ යුතුය. ඉන් පසුව ඔබ විසින් සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයන්හි ආයතන ප්‍රධානීන් ගේ අත්සන හා නිලමුද්‍රාව සහිත පැහැදිලි මෘදු පිටපත් (Soft Copy – PDF/ Scanned Images ) එම ගූගල් පෝරමය අවසානයට උඩුගත (Upload) කළ යුතුය.

Fin.chiefsec.wp.gov.lk → View in English → Downloads →
Imprest Limit → 2025 → Imprest Limit Google Form

5. 2025 වර්ෂයේ ඉදිරි මාස වෙනුවෙන් අක්මුදල් සීමාව යටතේ නිකුත් කළ යුතු අග්‍රිමය තීරණය කිරීම සඳහා ඔබගේ අක්මුදල් අවශ්‍යතාවය ඉහත අංක 4 හි සඳහන් කරන ලද ගූගල් පෝරමය (Google Form) 2025.05.09 දිනට පෙර මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කළ යුතු බව සලකන්න. එදිනට මෙම වාර්තාව ඉදිරිපත් නොකරන කාර්යාල වෙනුවෙන් අක්මුදල් නිදහස් කිරීම, සීමා කිරීම හෝ මවිසින් තීරණය කරන අග්‍රිම සීමාවක් නියම කිරීමට හෝ සිදුවන බවද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

6. පළාත් භාණ්ඩාගාරය විසින් මාසික අක්මුදල් නිකුත් කිරීමේදී අක්මුදල් සීමාව මෙන්ම පුද්ගල පඩිනඩි, පුනරාවර්තන, ප්‍රාග්ධන, සහ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් යන එක් එක් උප අග්‍රිම සීමාවන් ද සැලකිල්ලට ගනු ලබන බැවින් එම සීමාවන්ද නොඉක්මවන පරිදි අක්මුදල් ඉල්ලුම් කළ යුතුය.

7. කෙසේ වුවද අක්මුදල් ඉල්ලීම සඳහා ඔබ කාර්යාලය විසින් ඉදිරිපත් කරනු ලබන ගූගල් පෝරමයේ ඉල්ලුම් කරනු ලබන **අක්මුදල් වර්ගයද** නිසි පරිදි තෝරා සම්පූර්ණ කරන්න. අක්මුදල් ඉල්ලීම් සිදුකරන දිනවල ප.ව 12.00ට පෙර ගූගල් පෝරමය පුරවා එවීම අනිවාර්යය බවද කාරුණිකව දන්වමි.

8. 2025 වර්ෂයේ මැයි මස සිට අක් මුදල් නිදහස් කරනු ලබන්නේ මෙම අග්‍රිම සීමාව යටතේ බැවින් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර පිළියෙල කොට නියමිත දිනට පෙර ඉහතින් සඳහන් කළ ගූගල් පෝරමය පිරවීමට කළ යුතුය. මේ සම්බන්ධව වැඩිදුර පැහැදිළි කිරීමක් අවශ්‍යවේ නම් ඒ සඳහා පළාත් භාණ්ඩාගාරයේ 011-2092641 (ගණකාධිකාරී-පොත් තැබීම්) දරන අංකය හරහා සම්බන්ධ වන ලෙසද කාරුණිකව දන්වමි.

9. පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් මු.රී.44 පරිදි ඔබ ආයතනය වෙත අනුමත කරන ලද **අග්‍රිම සීමාව ඉක්මවා වියදම් කිරීම නොකළ යුතු අතර එම අග්‍රිම සීමාව පළාත් මු.රී.44.4 පරිදි පරිපූරක අග්‍රිම අධිකාරයක් ලබා ගෙන මිස සීමාව ඉක්මවා වියදම් සඳහා අක්මුදල් ඉල්ලුම් නොකිරීමට කටයුතු කළ යුතුය.**

10. 2025 වර්ෂය සඳහා අනුමත කරන ලද අක්මුදල් සීමාව සංශෝධනය කිරීමේදී සංශෝධනය කළ යුතු මුළු අක්මුදල් සීමාවට අදාලව ඉහත **අංක** 2 හි සඳහන් "**අ**" **ආකෘති පත්‍රය** සහ "**ආ**" **ආකෘති පත්‍රය** යන ආකෘති පත්‍ර සම්පූර්ණ කළ යුතුය. එහි සාරාංශ තොරතුරු ඉහත **අංක 4** හි සඳහන් ගූගල් පෝරමයට (අග්‍රිම සීමා සංශෝධන) ඇතුලත් කළ යුතු අතර අක්මුදල් සීමාව සංශෝධනයට අදාල හේතු සහිත ඇමුණුම් සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර දෙකහි **ආයතන ප්‍රධානීන් ගේ අත්සන හා නිලමුද්‍රාව සහිත මෘදු පිටපත්** (Soft Copy – PDF/ Scanned Images ) ගූගල් පෝරමය අවසානයට උඩුගත (Upload) කළ යුතුය. අනුමත අක්මුදල් සීමාව ඉක්මවීමට පෙර අක්මුදල් සීමාව සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතුය.

10. වර්ෂයේ අක්මුදල් සීමාව නියම කිරීමට හා සංශෝධනය කිරීමට අදාලව සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයන්හි ආයතන ප්‍රධානීන් ගේ අත්සන හා නිලමුද්‍රාව සහිත මුල් පිටපත් පළාත් භාණ්ඩාගාරය වෙත තැපැලෙන් හෝ ඊමේල් මඟින් එවීමට අවශ්‍ය **නොවන** බවද එම මුල් පිටපත් ඔබ සන්තකයේ සුරක්ෂිතව තබා ගැනීම **අනිවාර්යය** බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්.පී.වීරරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),
ප්‍රධාන ලේකම්,පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත :-
i. විගණකාධිපති,
ii. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
iii. අධ්‍යක්ෂ (ආදායම්)
iv. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)

"අ" ආකෘතිය

# වාර්ෂික අක් මුදල් අයදුම් පත්‍රය - 2025 වර්ෂය

(අක් මුදල් සීමා නියම කිරීම හා සංශෝධනය කිරීම)

000'

ආයතනයේ නම :

| ශීර්ෂය | වැඩසටහන | ප්‍රතිපාදන | | එකතුව | වෙනත් හරස් සටහන් ගෙවීම් | වෙනත් දෙපාර්තමේන්තු වලට වෙන් කිරීම් | එකතුව (5+6) | පළාත් භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මුදල (4-7) | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුදල් ප්‍රකාශයට අනුව ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු සමග) | වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබී ඇති ප්‍රතිපාදන | | | | | | |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| | 1 | | | | | | | | |
| | 2 | | | | | | | | |
| | 3 | | | | | | | | |
| වෙනත් ඉල්ලීම් | | | | | | | | | |
| | | | | | | | | | |
| 1. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | | | | | | | | | |
| 2. වාණිජ අත්තිකාරම් ගිණුම | | | | | | | | | |
| 3. තැන්පත් ගිණුම | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.............................................................................................

අමාත්‍යාංශ ලේකම් / දෙපාර් තමේන්තු ප්‍රධානියා / ප්‍රාදේශීය ලේකම්

දිනය:

නිල මුද්‍රාව:

"අ" ආකෘතිය

# වාර්ෂික අත් මුදල් අයදුම් පත්‍රය - 2025 වර්ෂය

(අත් මුදල් සීමා නියම කිරීම හා සංශෝධනය කිරීම)

ආයතනයේ නම :

000'

| ශීර්ෂය | වැඩසටහන | ප්‍රතිපාදන | | එකතුව | වෙනත් හරස් සටහන් ගෙවීම් | වෙනත් දෙපාර්තමේන්තු වලට වෙන් කිරීම් | එකතුව (5+6) | පළාත් භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මුදල (4-7) | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුදල් ප්‍රකාශයට අනුව ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු සමග) | වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබී ඇති ප්‍රතිපාදන | | | | | | |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| | 1 | | | | | | | | |
| | 2 | | | | | | | | |
| | 3 | | | | | | | | |
| වෙනත් ඉල්ලීම් | | | | | | | | | |
| | | | | | | | | | |
| 1. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | | | | | | | | | |
| 2. වාණිජ අත්තිකාරම් ගිණුම | | | | | | | | | |
| 3. තැන්පත් ගිණුම | | | | | | | | | |
| **එකතුව** | | | | | | | | | |

ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

..............................................................................

අමාත්‍යාංශ ලේකම් / දෙපාර් තමේන්තු ප්‍රධානියා / ප්‍රාදේශීය ලේකම්

දිනය:

නිල මුද්‍රාව:

# වාර්ෂික අක් මුදල් අවශ්‍යතාවය - වියදම් අයිතම අනුව
## 2025 වර්ෂය

| වියදම් අයිතම (වියදම් කේතයන් සමඟ) | අනුමත වියදම් සඳහා අක් මුදල් අවශ්‍යතාවය (රු.) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
| වැටුප් සහ දීමනා (1001 සහ 1003) | | | | | | | | | | | | | |
| වැටුප් සමඟ ගෙවන අනෙකුත් දීමනා (1003 හැර) | | | | | | | | | | | | | |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් (1002) | | | | | | | | | | | | | |
| අනෙකුත් සියළුම පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | | |
| **මුළු පුනරාවර්තන වියදම** | | | | | | | | | | | | | |
| අනෙකුත් සියළුම ප්‍රාග්ධන වියදම් | | | | | | | | | | | | | |
| රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | | | | | | | | | | | |
| තැන්පතු ගිණුම | | | | | | | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | | | | | | |

ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.........................................................................................................

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / ප්‍රාදේශීය ලේකම්

දිනය:

නිල මුද්‍රාව: